**කුලියාපිටිය නගර සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුලියාපිටිය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181 (I) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (I) උපවගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) උපවගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගෙන තිබූ ලී බඩු උපකරණ 04 ක වටිනාකම රු.348,550 ක් සහ රු.453,550 ක් වූ යන්ත්‍ර සහ උපකරණ 07 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ මණ්ඩල තීරණ අනුව අපහරණය කළ ලී බඩු උපකරණ 12 ක වටිනාකම රු.163,543 ක් වත්කම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ලේඛන අනුව ලංසු ආරක්ෂණ ඇප තැන්පත් ශේෂය රු.971,675 ක් වුව ද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.1,402,630 ක් ලෙස රු.430,955 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් වී නොමැති නඩු කටයුත්තක් පැවති අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | -එම- | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු ය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය හා ඊට අදාළ උපලේඛනවල පැවති ශේෂය අතර රු.13,036,162 ක නොසැසඳීමක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතු ය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති.රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම ,රීති ,**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 570 හා 571 | වටිනාකම රු.8,691,018 ක් වූ ඉකුත් වූ තැන්පත් 514 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි. | සභාව සතු වාහනවල බඳෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | පිළිගන්නා බව | චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| (i) | අංක 2018/elocal government 01 හා 2018/07/19 දිනැති චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් කටයුතු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා දී නොතිබුණි. | -එම- | -එම- |
| (ii) | අංක 2010/02 හා 2010/07/30 දිනැති චක්‍රලේඛයේ 1.2. ii. වගන්තිය | රාජකාරි කිරීමේ දී විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.39,671,397 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.179,885,209 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 28,675 | 28,288 | 25,737 | 28,860 | 28,675 | 26,736 | 26,867 | 28,196 |
| කුලී | 216,636 | 25,075 | 24,524 | 3,609 | 216,636 | 21,065 | 20,060 | 3,197 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| බලපත්‍ර ගාස්තු | 17,930 | 21,087 | 3,907 | - | 17,930 | 12,197 | 12,089 | - |
| වෙනත් ආදායම් | 210,903 | 138,079 | 154,288 | 13,270 | 44,815 | 123,022 | 295,935 | 14,009 |
| | ----------- | ----------- | ---------- | ------------ | ------------- | ----------- | ------------ | ------------ |
| එකතුව | 474,144 | 212,529 | 208,456 | 45,739 | 308,056 | 183,020 | 354,951 | 45,402 |
| | ======= | ====== | ======= | ======= | ======= | ====== | ======= | ======= |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.28,860,313 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ බදු මුදල කඩිනමින් අය කළ යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට 2020 ජනවාරි මාසයේ සිට අයවිය යුතුව පැවති හිඟ තානායම් කුලිය රු.2,062,413 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ තානායම් කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති නගර සභා ගොඩනැගිලි හිඟ කුලි ශේෂය රු.244,500 ක් විය. | -එම- | හිඟ නගර සභා ගොඩනැගිලි කුලී ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා නව වෙළඳ සංකීර්ණයේ කඩ කුලී රු.195,248,200 ක් ඇස්තමේන්තු කර තිබුණ ද , වර්ෂය තුළ අයවීම ශුන්‍ය විය. | -එම- | ඇස්තමේන්තුව හැකිතාක් දුරට තාත්වික විය යුතු ය. |
| (ඉ) | නගර සභාවේ ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.1,855,675 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟවන බව | හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම.

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 04 ක් සම්බන්ධයෙන් පමණක් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | පනතේ 126 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.1,278,263 ක වියදමක් දරා තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව කොම්පෝස්ට් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 3,810 කින් අඩු වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු ය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 12 ක වටිනාකම රු.49,711,408 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතු වටිනාකම රු.837,768,595 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු ය. |
| (ඇ) | නගර සභාව සතු පොදු වෙළඳපල අංක 02 කඩකාමරය 2018 වර්ෂයේ බදු ලබාගත් පුද්ගලයා රු.1,084,482 ක බදු කුලී ගෙවීම පැහැර හැර තිබීම හේතුවෙන් නඩු පවරා තිබුණ ද, සභාවට ලබා දී තිබූ ලිපිනයෙහි පදිංචිය හැරගොස් තිබීම හේතුවෙන් නඩු කටයුත්ත නතර වී තිබුණු නමුත් අදාළ ඉදිරි නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඇස්තමේන්තුගත පිරිවැය රු.10,425,000 ක් වූ ව්‍යාපෘති 17 ක් සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ව්‍යාපෘති ඉටු කිරීමේ දී කාල ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය තුළ ලී බඩු සහ උපකරණ පිළිබඳ තොරතුරු පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරන ඉඩම් 07 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වත්කම්වල අයිතිය පවරා ගත යුතු ය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 72 ක් වූ අතර අතිරික්ත කාර්යමණ්ඩලය 01 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාර්යය මණ්ඩලය අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතු ය. |

### 3.5 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ නමට ලියාපදිංචි නොකළ වාහන 06 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වාහන ලියාපදිංචි කළ යුතු ය. |
| (ආ) | අපහරණය සඳහා නිර්දේශ කර තිබූ ට්‍රැක්ටරයක් ටේලරයක් සහ තණකොළ කපන යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපහරණ කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අපහරණය කළ යුතු වත්කම් අපහරණය කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 4 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | -එම- | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර එහි රාජකාරි සඳහා නිලධාරියකු පත්කර තිබූ නමුත් සභාවේ සියලු කටයුතු ආවරණය වන පරිදි උචිත සහ ප්‍රමාණවත් විගණනයක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ බව | සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු ය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 25 සිට 774 දක්වා ද වියදම් විෂයයන් 07 ක සියයට 40 කට වඩා වැඩියෙන් ද විචලනයක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වසර මුල ආදායම් හා වියදම් සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර අයවැය ලේඛනය සකස් කළ යුතු ය. |

### 4.3 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රු.1,017,715,000 ක් ප්‍රතිපාදන වෙන්කර සැලසුම් කර තිබූ සංවර්ධන වැඩසටහන් 23 ක් සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබූ අතර රු.1,026,085,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය රු.2,253,344 ක් එනම් සියයට 0.2 ක් පමණක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කරගත යුතු ය. |